ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1997 අංක 29 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1997 නොවැම්බර් මස 24 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 නොවැම්බර් මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 3.50 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

## 1997 අංක 29 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1997 නොවැම්බර් මස 24 වන දින.]

එල්.ඩී.-ඕ. 78/95.

**1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1997 අංක 29 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *(ලුහුඬු නාමය.)*

2. 1981 අංක 58, 1983 අංක 29, 1987 අංක 50 දරන පනත්වලින් සංශෝධිත, 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ 18 වන වගන්තියේ "නියම බලධරයා" යන්නෙහි අර්ථ කථනය පහත දැක්වෙන පරිදි මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :— *(1979 අංක 7 දරන පනතේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

(i) එම අර්ථ කථනයේ (උ), (ඌ), (ඍ) සහ (එ) ඡේද පිළිවෙලින් එහි (එ), (ඒ), (ඔ) සහ (ඕ) ඡේද වශයෙන් නැවත අකුරු යෙදීමෙන් ; සහ

(ii) එම අර්ථ කථනයේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(උ) ඒ ඉඩම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පවත්නා අවස්ථාවක, කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා ද ;

(ඍ) ඒ ඉඩම නීතියෙන් ඇති කරන ලද වෙනත් යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ ආයතනයක පාලනය යටතේ පවතින අවස්ථාවක, ඒ දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානයා ද ;".

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. *(අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.)*

2—D 044906 – 5,900 (97/04)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.